# සියදිවි හානී - කවි අභිමාණී

සිත් වේදනා ඉවසා ගත නොහී          සෙමින්
වල් නාශක දියරයක රස සොයා          ගිහින්
පත්වූ රුදු මරණයේ දුක නසා          උපන්
අත්වූ සහනයක් මිහිපිට නොවේ          ඉතින්

ජීවිත පොතේ විසිතුරු සිතුවම්          සබඳ
මීවිත නිසා බොඳකර හැරියේ          කිමද
හාමත අඩන දරුවන් තනිකර          බිරිඳ
වාගත හැකිද ගිණිගෙන දැවෙනා          සුවඳ

කාටත් ගැටළුවක් ණය බර          ඉසිලීම
ණය හිමියන් ඇවිත් තර්ජන කර          යාම
නිසි ඔවදන් පිණිස සුමිතුරු වෙත          යාම
වෙනුවට පිළියමද මුහුදට          බිලිවීම

සිරිලක සුමිතුරෝ ඔබ වෙනුවෙනි          ඉන්නේ
ගැටළුව රැගෙන නොපැකිල අප වෙත          එන්නේ
ආදරයෙන් සුහඳ ලෙස අප කැප          වන්නේ
විසිරුනු සිතට සැනසුම සැදූමයි          වෙන්නේ

**ජයන්ත උඩකන්දගේ**